සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**09 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **11 S**

**බුද්ධ ධර්මය I, II** **කාලය පැය දෙකයි**

නම හා විභාග අංකය

උපදෙස් :

- පළමු කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට ඉතාමත් නිවැරදි පිළිතුර තෝර එයට යටින් ඉරක් අඳින්න. (2x20=40)
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- 02 ප්‍රශ්නයේ සිට 06 වන ප්‍රශ්නය දක්වා පළමු කොටසට ලකුණු 2ක් ද දෙවන කොටසට ලකුණු 03 ක්ද තුන්වන කොටසට ලකුණු 5 ක්ද හිමි.
- 7 වන ප්‍රශ්නයට එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු 10 ක් හිමි වේ.

බුද්ධ ධර්මය I

01) " එතැන් පටන් පන්සාළිස් වසක් පුරාවට ම මහා කරුණාවෙන් ලෝකයාට දහම් මග පෙන්වා දුන් උන් වහන්සේ අවසන් වස්කාලය ගත කළේ බේලුව ගමෙහිය." මෙහි පන්සාළිස් වසක් යනු,
i) අවුරුදු 45 කි. ii) අවුරුදු 35 කි. iii) අවුරුදු 55 කි. iv) අවුරුදු 48 කි.

02) මහා රුකක් මුල සඟල සිවුර සතරට නවා බිම එලා වැඩ සිටි උන් වහන්සේ " ආනන්ද ය මට පිපාසයි පැන් ටිකක් සොයා ගෙන එන්නැයි " වදාළහ. මෙම ප්‍රකාශය කරන ලද්දේ,
i) කාශ්‍යප හිමියන් විසින් ආනන්ද හිමියන්ට.
ii) සැරියුත් හිමියන් විසින් ආනන්ද හිමියන්ට.
iii) බුදුරජාණන් වහන්සේ විසින් ආනන්ද හිමියන්ට.
iv) චුන්ද තෙරුන් විසින් ආනන්ද හිමියන්ට.

03) ශ්‍රේෂ්ඨ නායකයකුට සබැවින්ම අකර්ශනීය වාග් විලාශයක් පවතී යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,
i) බිම්බිසාර රජතුමා විසින් ය. ii) උදේනී රජතුමා විසින් ය.
iii) අජාසත් රජතුමා විසින් ය. iv) කොසොල් රජතුමා විසින් ය.

04) අධි ශීල, අධි චිත්ත අධි ප්‍රඥාවෙන් යුක්තව ඍජු ප්‍රතිත්තියෙහි යෙදෙන බැවින් සංඝ රත්නය,
i) ඤායපටිපන්න වන සේක. ii) උජුපටිපන්න වන සේක.
iii) සුපටිපන්න වන සේක. iv) සාමීචිපටිපන්න වන සේක.

05) " සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා - සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා " කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
i) බුදුගුණ අංලකාරයේ ය. ii) සුභාෂිතයේ ය. iii) ලෝවැඩ සඟරාවේය. iv) ගුත්තිල කාව්‍යයේ ය.

06) බුද්ධත්වයෙන් පස්වන වර්ෂයෙහි බක් පොහොය දිනක මැණික් පුටුව වෙනුවෙන් අරගල කළ චූලෝදර මහෝදර නාග ගෝත්‍රිකයන් දමන කිරීමට නාගදීපයට වැඩම කළහ. එය අයත් වන්නේ,
i) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයටයි. ii) බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයටයි.
iii) ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයටයි. iv) සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයටයි.

07) හුස්ම ගැනීමත් හුස්ම පිට කිරීමත් පිළිබඳ සිහිනුවණ පිහිටුවීමට මඟ පෙන්වන භාවනාව වන්නේ,
i) බුද්ධානුස්සති භාවනාවයි. ii) සක්මන් භාවනාවයි.
iii) ආනාපානසති භාවනාවයි. iv) විදර්ශනා භාවනාවයි.

08) දෙව්දහනුවර අංජන රජුගේ හා යශෝදරා දේවියගේ දෙවන දියණිය වන බුද්ධමාතා යන නාමයෙන් හැඳින්වූයේ,
i) ඛෙමා දේවිය යි. ii) මහා ප්‍රජාපති ගෝතමී දේවිය යි.
iii) උප්පලවන්නා දේවිය යි. iv) බිම්බා දේවිය යි.

09) මෙලොව පරලොව දියුණුව මෙන්ම නිවන් අරමුණු ද සපුරා ගැනීම සඳහා සදුපදේශ සපයන ධම්මපදය,
i) සූත්‍ර පිටකයේ දීඝ නිකායට අයත් වේ. ii) සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායට අයත් වේ.
iii) සූත්‍ර පිටකයේ සංයුක්ත නිකායට අයත් වේ. iv) සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් වේ.

10) " කරන කලට පව් මිහිරිය මී සේ " යැයි වීදාගම මා හිමියන් ප්‍රකාශ කරන ලද පද්‍ය කොටස ඇතුළත් වන්නේ,
   i) කෝට්ටේ යුගයේ රචනනා කරන ලද ලෝවැඩ සඟරාව නම් ග්‍රන්ථයේ ය.
   ii) කෝට්ටේ යුගයේ රචනනා කරන ලද බුදු ගුණ අලංකාරය නම් ග්‍රන්ථයේ ය.
   iii) කෝට්ටේ යුගයේ රචනනා කරන ලද කාව්‍යශේඛරය නම් ග්‍රන්ථයේ ය.
   iv) කෝට්ටේ යුගයේ රචනනා කරන ලද ගුත්තිල කාව්‍ය නම් ග්‍රන්ථයේ ය.

11) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත්වන ස්වභාවය
   i) මෙත්තාව නම් වේ.   ii) කරුණාව නම් වේ.
   iii) මුදිතාව නම් වේ.   iv) උපේක්ෂාව නම් වේ.

12) "  මහා ගල් පර්වතයත් වාතයෙන් නොසෙල්වෙන්නාක් මෙන් නුවණැත්තා නින්දා ප්‍රශංසා දෙකෙහිම නොසෙල් වී කටයුතු කරයි. " මෙයට අයත් ධම්ම පද ගථාව වන්නේ,
   i) " පුට්ඨස්ස ලෝක ධම්මේහි " යන ගාථාවයි.
   ii) " සේලෝ යථා ඒකඝනෝ "යන ගාථාවයි.
   iii) " ලාභෝ අලාභෝ අයසෝ යසෝ " යන ගාථාවයි.
   iv) " සුකරානි අසාධූනි " යන ගාථාවයි.

13) බුදුරජාණන් වහන්සේ ප්‍රශංසා කරන්නේ , අගය කරන්නේ , අඩු බලාපොරොත්තු ඇති අසීමිත ආශාවන් ඇති ජීවිතයයි. එහි දී " සල්ලවුකවුත්ති " යනු,
   i) ඉන්ද්‍රිය සංවර බවයි.   ii) ලද දෙයින් සතුටු වීම.
   ii) පෝෂණ කිරීමේ පහසුවයි.   iv) සැහැල්ලු පැවතුම් ඇති බවයි.

14) ආර්ය අෂ්ටාංගික මාර්ග මධ්‍යම ප්‍රතිපදාව නමින් හඳුන්වයි. එම අංග අට සීල, සමාධි, පඤ්ඤා යනුවෙන් කොටස් වේ. එහි දී සීලට අයත් අංගයක් නොවන්නේ,
   i) සම්මා වචාවයි.   ii) සම්මා අජීවය යි.   iii) සම්මා වායාමය යි.   iv) සම්මා කම්මන්තයි.

15) දිළිඳුකම ඇතිකල සොරකම ඇති වේ. සොරකම ඇතිකල අවි ආයුධ ගැනීම සිදු වේ. ඒ ආකාරය සමාජයේ නොයෙක් අකුසල ධර්මයන් පැතිර යන්නේ එකිනෙකට බලපාන හේතු සාධක නිසා මේ පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ,
   i) මහා මංගල සූත්‍රයේ ය.   ii) චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
   iii) සිගාලෝවාද සූත්‍රයේ ය.   iv) කරණීයමෙත්ත සූත්‍රයේ ය.

16) වජ්ජිපුත්තක භික්ෂූන් විසින් පිළිගන්නා ලද දස වස්තුව විනය විරෝධි යැයි සංඝ සම්මුතියෙන් ප්‍රතික්ෂේප කිරීම.
   i) පළමු සංගායනාවේ දී සිදු විය.   ii) දෙවන සංගායනාවේ දී සිදු විය.
   iii) තුන්වන සංගායනාවේ දී සිදු විය.   iv) සතරවෙනි සංගායනාවේ දී සිදු විය.

17) ධර්මසේන හිමියන් දඹදෙණි යුගයේ දී ධම්මපදට්ඨ කතාවේ එන කථා පරිවර්තනය කරමින් ගැමියන්ට උචිත පරිදි කරුණු ඉදිරිපත් කරමින් රචනා කරන ලද ග්‍රන්ථය වන්නේ,
   i) සද්ධර්මරත්නාවලිය යි.   ii) කව්සිළුමිණයි.   iii) පූජාවලිය යි.   iv) බුත්සරණනයි.

18) " ළඟ නොබලන්න දුර බලන්න " යනුවෙන් පිය රජතුමා ලබා දුන් උපදේශය පැහැදිලි වන්නේ ඉවසීමේ බුද්ධිමත් භාවයේ වැදගත්කමයි. මෙය සඳහන් වන්නේ,
   i) වණ්ණුපථ ජාතක කතාවෙහි ය.   ii) අපණ්ණක ජාතක කතාවෙහි ය.
   iii) දීඝිති කෝසල ජාතක කතාවෙහි ය.   iv) වෙස්සන්තර ජාතක කතාවෙහි ය.

19) මහනුවර රාජධානි සමයේ දී වැලිවිට අසරණ සරණ සරණංකර මාහිමිපාණන් විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් නොවන්නේ,
   i) සාරාර්ථ සංග්‍රහය.   ii) සතර බණවර සන්නය.
   iii) මුණිගුණාලංකාරය.   iv) දහම්සොඬ  කව.

20) බුදු දහම දේශාන්තර ව්‍යාප්තිය සඳහා රටවල් නමයක් සඳහා ධර්ම දූතයන් පිටත් කර හරින ලදි. ඒ අතර තම්බපණ්ණියට වැඩම කළේ,
   i) මහා දේව ඇතුළු ධර්ම දූත පිරිසයි.   ii) සෝණඋත්තර හිමි ඇතුළු  පිරිසයි.
   iii) මිහිදු හිමි ඇතුළු ධර්ම දූත පිරිසයි.   iv) රක්ඛිත හිමි ඇතුළු  පිරිසයි.

**උපදෙස් : පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01) i) බුදුරජාණන් වහන්සේට අවසන් වරට දානය පූජා කළේ කවුරුන්ද? පූජා කළ දානය කුමක්ද නම් කරන්න.
ii) " යථාවාදී තථාකාරී බව හා යථාකාරී තථාවාදී " යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
iii) සතර අගතියෙන් දෙකක් නම් කරන්න.
iv) " මිහිඳු දෙසූ විලසින - මහඟු පිළිවෙත් සුරකින " යන කවියේ ඉතුරු පද දෙක ලියන්න.
v) භාවනාව ප්‍රගුණ කිරීමේ දී ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් වාඩි වීමට සුදුසු ක්‍රම නම් කරන්න.
vi) වස් විසූ භික්ෂුණිය " උභතෝ " සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතුයි. මෙහි " උභතෝ " යන්නෙන් සඳහන් වන්නේ කවුරුන්ද යන්න නම් කරන්න.
vii) භද්දකච්චානා නම් රාහුල මාතාවට භාවිතා කරන වෙනත් නම් දෙකක් ලියන්න.
viii) බෞද්ධයාගේ අත්පොත වන ධම්ම පදයේ ගාථා ප්‍රමාණය හා වර්ග ප්‍රමාණය නම් කරන්න.
ix) චතු අප්පමඤ්ඤා වලින් දෙකක් නම් කරන්න.
x) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පඤ්ඤා ශික්ෂාවට අයත් අංග දෙක නම් කරන්න.

02) i) " හන්දදානි භික්ඛවේ.... " යන පාඨය සම්පූර්ණ කරන්න.
ii) සැදැහැතියන් විසින් දැක සංවේගය පහළ කරගත යුතු ස්ථාන හතරෙන් තුනක් නම් කරන්න.
iii) බුදුරජාණන් වහන්සේගේ නායකත්ව ලක්ෂණ අතරින් දෙකක් පිළිබඳ පැහැදිලි කරමින් , බිත්ති පුවත් පතකට ලිපියක් පිළියෙළ කරන්න.

03) i) සීලයේ මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
ii) ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න.
iii) " පන්සිල් සුරකිමු " යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

04) i) තුන්වන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගත් හිමියන් සහ අනුග්‍රහය දැක් වූ රජතුමා නම් කරන්න.
ii) තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල 3 ක් ලියන්න.
iii) ශාසනයේ චිර පැවැත්මට හා ව්‍යාප්තිය උදෙසා තෙවන ධර්ම සංගායනාවෙන් සිදු වූ මෙහෙය පැහැදිලි කරන්න.

05) i) බුදුදහම තුළ කර්ම සංකල්පය නිර්වචනය කරන වැකිය ලියා දක්වන්න.
ii) බුදුරජාණන් වහන්සේට සහ රහතුන් වහන්සේලාට විපාක දුන් අකුසල කර්ම අවස්ථා 3ක් නම් කරන්න.
iii) හොඳ නරක කර්ම වල විපාක ඇති වේ. විශ්වාස කිරීමේන ඔබටත් සමාජයටත් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව විස්තරයක් කරන්න.

06) i) සිගාලෝවාද සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ සදිසාවන් අතරින් දෙකක් ලියා දක්වන්න.
ii) ස්වාමියා විසින් සේවකයාට ඉටු කළ යුතු යුතුකම් ලියා දක්වන්න.
iii) නිවැරදි යුතුකම් ඉටු කිරීමෙන් එකිනෙකා අතර සුහදතාවෙන් සාරධර්ම සුරක්ෂිත වන ආකාරය ඔබ උගත් සම්බන්ධතා තුළින් විස්තර කරන්න.

07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
i) බලංගොඩ මහානායක හාමුදුරුවෝ.
ii) වැවයි දාගැබයි ගමයි පන්සලයි.
iii) චතුරාර්ය සත්‍යය.
iv) බෞද්ධ කලාව.

* * * *

## තෙවන වාර පරීක්ෂණය - 2019

## බුද්ධ ධර්මය

09 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01) | i | 06) | i | 11) | iii | 16) | ii |
| 02) | iii | 07) | iii | 12) | ii | 17) | i |
| 03) | iv | 08) | ii | 13) | iv | 18) | iii |
| 04) | ii | 09) | iv | 14) | iii | 19) | iv |
| 05) | iii | 10) | i | 15) | ii | 20) | iii |

### II - කොටස

01) i) චුන්දකර්මාන පුත්‍රයා , සූකර මද්ධව
ii) කියන දේ කරන, කරන දේ කියන
iii) ඡන්ද, ද්වේෂ, භය, මෝහ
iv) අරිය අට සඟ ගණ - සුපටිපන්න කියා පැවසිණ.
v) අර්ධ පර්යංකයෙන් - ගැහැණු , බද්ධ පර්යංකයෙන් - පිරිමි
vi) භික්ෂු, භික්ෂුණී
vii) යශෝධරා දේවි , බිම්බා දේවි
viii) ගාථා - 423 වර්ග - 26
ix) මෙත්තා , කරුණා, මුදිතා , උපේක්ෂා
x) සම්මා දිට්ඨි , සම්මා සංකප්ප

02) i) " හන්දදානි භික්ඛවේ - ආමන්තයාමි වෝ
වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ"
ii) බෝසතානෝ උපන් තැන, බුදු රජුන් සම්බුද්ධත්වයට පත් වූ තැන, දම්සක් දෙසූ තැන, බුදුරජුන් පිරිනිවන් පෑ තැනය.
iii) 8 පිටුවේ සිට 14 පිටුව දක්වා ඇති නායකත්ව ලක්ෂණ වලින් දෙකක් නම් කොට දෙකක් පිළිබඳ කරුණු දක්වා තිබේ නම් ලකුණු ලබා දෙන්න.

03) i) චාරිත්‍ර සීලය , වාරිත්‍ර සීලය
ii) පව් කම් නොකිරීම, පව්කම් නොකරවීම, අන්අය කරන විට අනුමත නොකිරීම.
iii) මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කොට ඇතිනම් ලකුණු ලබා දෙන්න.

04) i) මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ - මූලිකත්වය
ධර්මාශෝක රජතුමා - අනුග්‍රහය
ii) (i) දුර්මතධාරී භික්ෂූන් වහන්සේලා , හැටදහසක් සසුනෙන් නෙරපා හැරීම.
(ii) පොහොය කර්ම ආදී සාමූහිකව සිදු කිරීමට භික්ෂූන් වහන්සේලාට හැකිවීම.
(iii) දුර්මත පන්සියයක් හඳුනාගෙන ඒවාට පිළිතුරු වශයෙන් ධර්ම කරුණු පන්සියයක් එකතු කොට කතාවත්ථුප්පකරණය රචනා කිරීම.
( ඉදිරිපත්කොට ඇති කරුණු බලා ලකුණු ලබා දෙන්න.
(iv) බුදු දහම දේශාන්තර කර ව්‍යාප්තිය.

05) i) " චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්ම කරෝති
කායේන වාචාය මනසා " මහණෙනි මම චේතනා කර්ම යැයි කියමි. සිතින් සිතා කයින් වචනයේ හා මනසින් කර්ම රැස් කරයි.
ii) පූර්ණ කස්සප, මක්ඛලීගෝසාල, පකුධ කච්චායන, අජිත කේශකම්බලී, සංජය බෙල්ලට්ඨි පුත්ත, නිගන්ඨනාථ පුත්ත
iii) 98 වන පිටුවේ සඳහන් කරුණු ඉදිරිපත් කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06) i) මව්පියන් - නැගෙනහිර ( මව්පිය දූදරු) ගුරුවරුන් - දකුණින් ( ගුරු සිසු )
අඹු සැමියන් - බටහිර ( ස්වාමි භාර්යා ) යහළුවන් - උතුර ( මිතුරෝ )
සේවකයේ - යට ( ස්වාමි සේවක ) පැවිදි - උඩ ( ගිහි පැවිදි)
ii) සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ කොටස් පැවරීම.
නිසි පරිදි ආහාර හා වැටුප් ලබා දීම.
සෞඛ්‍ය පහසුකම් ලබා දීම.
රසවත් ආහාර පාන ලබා දීම.
අවශ්‍ය අවස්ථාවල දී නිවාඩු ලබා දීම හා නිසි කලට විශ්‍රාම ලබා දීම.
iii) අවශ්‍ය කරුණු ඉදිරිපත් කොට ඇති ආකාරය පරීක්ෂා කොට ලකුණු ලබා දෙන්න.

07) i) මූලික තොරතුරු , ඉගෙනීම සම්බන්ධව කරන ලද ආගමික සේවාව, ලැබුණු ගෞරව නාම, ලබා ගත හැකි ආදර්ශ. කරුණු බලා ලකුණු ලබා දෙන්න.
ii) ඉදිරිපත් කොට ඇති කරුණු බලා ලකුණු ලබා දෙන්න.
- ⋆ මිහිඳු හිමියන් ඉදිරිපත් කළ ජීවන දර්ශනය.
- ⋆ බෞද්ධ සංස්කෘතිය හා වාපි සංස්කෘතිය අතර සම්බන්ධය.
- ⋆ විහාරස්ථානයෙන් හා භික්ෂූන් වහන්සේලාගෙන් ලැබුණු දායකත්වය.

iii) දම්සක් පැවතුම් සූත්‍රයට අනුව කරුණු පැහැදිලි කොට තිබීම.
දුක්ඛ ආර්ය සත්‍යය , දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය , දුක්ඛ නිරෝධ පටිපදා ආර්ය සත්‍යය. ආදී වශයෙන් නම් කොට කෙටියෙන් පැහැදිලි කොට තිබේ නම් ලකුණු ලබා දෙන්න.
iv) බෞද්ධ චිත්‍ර කලාව :-